# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ)

**සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එඩ්වඩ් ගුණසේකර මහතා විසින්
2016 මැයි මස 04 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 අප්‍රේල් මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[103 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009911—225 (2016/05)

## සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ)

### සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය'' යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, එහි සියලු පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ මීරිගම, මිණිඔළුවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක    දරන ''සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය'' (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු (''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු ''සංගමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) '' සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජ සේවා සංගමය'' යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

PL 009874 -300 (2016/04)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) බුදු සසුන ව්‍යාප්තිය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම;

(ආ) බෞද්ධ දහම් පාසල් පිහිටුවීම, පවත්වාගෙන යාම සහ ඒවාට අධාර කිරීම ;

(ඇ) අනාථ දරුදැරියන් නගා සිටුවීමට ආධාර දීම සහ ඒ සඳහා මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ඈ) ජාතික හා සමාජයික වශයෙන් මානව සමාජය තුළ අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, අධ්‍යාපනික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහිලා නිරත වීම ;

(ඊ) අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ දැනුම දියුණු කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මූල්‍යාධාර සහ ආධාර සැපයීම ;

(උ) යම් කර්මාන්තයක හෝ වෘත්තියක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරත වීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ වැනි ව්‍යාපෘති ආරම්භ කොට පවත්වාගෙන යාම සඳහා තැනැත්තන්ට ආධාර දීම, සහාය වීම සහ තාක්ෂණය හා ශිල්පීය ක්‍රම ජනතාවට සාර්ථක ලෙස ලබාදීම සඳහා සුදුසු වැඩසටහන්, ව්‍යාපෘති සේවා සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ඌ) පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භකොට පවත්වාගෙන යාම;

(එ) පුස්තකාල සේවාවක් පිහිටුවා පවත්වාගෙන යාම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් දේශීය හෝ විදේශීය ආයතන හෝ සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හෝ සම්බන්ධීකරණය වීම;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශන සඳහා අනුග්‍රහ දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඕ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යැයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීම; සහ

(ක) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව.

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට දීමට හෝ බද්දට ගැනීමට හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා පොලී සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමට හෝ ලබාගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට , භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටපත් කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හා නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් පාලක මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි, යම් තැනැත්තකු හෝ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) යම් වංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යානුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු දේ කිරීමට.

සංස්ථාවට බලය ඇත්තේ ය.

භාරකාර මණ්ඩලය හා එහි බලතල.

**5.** (1) සංගමයට අයත් අරමුදල් සහ නිශ්චල හා වංචල දේපළ සංගමය වෙනුවෙන් භාරකාර මණ්ඩලය දරනු ඇත.

(2) එකී භාරකාර මණ්ඩලයේ අනුමැතියකින් තොරව භාර දේපළ සම්බන්ධයෙන් කිසිවක් නොකළ යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පොරතුවම වූ දිනයේ දී සංගමයේ, පැවති භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ, තැනැත්තන්ගෙන් සමන්විත වූ භාරකාර මණ්ඩලය විය යුතු ය.

(4) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව සතු අරමුදල් හා වංචල දේපළ සම්බන්ධයෙන් ඕනෑම නීත්‍යානුකූල ක්‍රියා මාර්ගයක් ගැනීමට ද, නව අරමුදලක් ඇති කිරීමට, නිශ්චල හා වංචල දේපළ සංස්ථා සතු කර ගැනීමට අවශ්‍ය වන්නා වූ නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට ද භාරකාර මණ්ඩලයට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම.

**6.** (1) සංස්ථාවේ කටයුතු තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, පරිපාලනය කිරීම, එම රීති ප්‍රකාර පත් කර ගනු ලබන විධායක අධ්‍යක්ෂවරයෙක් සහ පාලක මණ්ඩලයක් මගින් සිදු කෙරේ.

(2) සංස්ථාවේ පාලක මණ්ඩලයට, ප්‍රධාන සභාපතිවරයෙක් සහ සම ලේකම්වරු දෙදෙනෙක්, උප සභාපතිවරුන් තිදෙනෙක් භාණ්ඩාගාරිකවරයෙක්, සංවිධායකවරු තිදෙනෙක්, ගණන්

පරීක්ෂකවරයෙක් සහ ගරු විධායක අධ්‍යක්ෂතුමාගේ අභිමතය පරිදි පාලක මණ්ඩලයට ඇතුළත් කරනු ලබන තිදෙනෙකුත් වශයෙන් සාමාජිකයන් දාහතර දෙනෙක් (14) ඇතුළත් වේ.

(3) මේ වගන්තියේ (1) උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, පූජ්‍ය මකුලෑවේ විමල ස්වාමීන් වහන්සේ සංස්ථාවේ ප්‍රථම විධායක අධ්‍යක්ෂ විය යුතු ය.

(4) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ පාලක මණ්ඩලයේ සමාජිකයන් වූ, තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සාමාජික ලේඛනය.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයෙකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තකුගේම නම ඇතුලත් කළ සාමාජික ලේඛනයක් පවත්වාගෙන යාමට පාලක මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

සංස්ථාවේ රීති.

**8.** (1) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය යැයි පාලක මණ්ඩලය අදහස් කරන සියළු කාරණා සඳහා සංස්ථාව විසින් යම් සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී සංගමයේ බලපැවැත්වූ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට සංස්ථාවේ රීති ලෙස කලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන අන්දමට එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ජින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයින්, සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන, භාරකාර

මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදල් පාලනය කිරීම භාරකාර මණ්ඩලය විසින් කළ යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් පවත්වාගෙන යාමට පාලක මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයකදීම යටත්පිරිසෙයින් එක් වරක් වත් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු අතර, සංස්ථාවේ ආදායම් සහ වියදම්, ගිණුම් සහ ශේෂපත්‍රවල නිරවද්‍යතාවය, මණ්ඩලය විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයන් වන විගණකවරයකු හෝ විගණකවරයන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය

**11.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවැති සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට අය විය යුතු ණය සහ දායක මුදල් හා සම්මාදම් මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**12.** යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාග කිරීමක් තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු කර දෙනු ලබන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ කාර්යය සඳහා නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, විකිණීමට උකස් කිරීමට, බදු හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සංස්ථාවට සම්පූර්ණ බලය තිබිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**13.** සංස්ථාවේ විධායක අධ්‍යක්ෂවරයා, පාලක මණ්ඩලයේ සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ සංස්ථාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවෙකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

*සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.*

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියළු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, එම දේපළ සියල්ල මිණිඔළුව විද්‍යාවාස පිරිවෙන් විහාරස්ථානයට අයත් වන අතර, විහාරස්ථානයෙහි දියණුවට සහ මහ සංඝයා වහන්සේගේ පරිහරණය සඳහා එම දේපළ වෙන් වේ.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.